සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

57 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 13 - 2019**

විභාග අංකය ..............................

# නාට්‍ය හා රංගකලාව I
## පෙරදිග නාට්‍ය කලාව

කාලය පැය තුනයි

- **I කොටස සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.**
- **II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## I - කොටස

- **එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය, ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

01. ආහාර්ය අභිනයට අයත් අංගයන් අන්තර්ගත වන්නේ,
   1. රූපණය, නාට්‍ය පෙළ, පූස්ත, රංගාලෝකය
   2. ආභරණ, සංගීතය, රූපණය, රංග විධාන
   3. රංග විධාන, අංග රචනා, සංවාද, සංගීතය
   4. සංගීතය, රූපණය, සංවාද, ආභරණ
   5. රංගාලෝකය, අංග රචනය, සංගීතය, ආභරණ (.........)

02. නෘත්‍යයට අයත් වන්නේ,
   1. අංග චලන 2. වාද්‍ය වෘන්දය 3. සාත්වික අභිනය
   4. සංගීතය 5. අංග රචනය (.........)

03. සාත්වික භාව හතරක් අන්තර්ගත වරණය වන්නේ,
   1. ස්තම්භ, ග්ලානි, අශ්‍රැ, වෛවර්ණ 2. ශංකා, රෝමාංච, අශ්‍රැ ප්‍රලය
   3. ස්ථම්භ, රෝමාංච, වේපථු, ස්වරභංග 4. ප්‍රලය, ස්මෘතිය, රෝමාංච, අශ්‍රැ
   5. අශ්‍රැ, ස්තම්භ, වේපථු, නිද්‍රා (.........)

04. ලෝකධර්මී, නාට්‍යධර්මී ලෙස කොටස් දෙකක් ඇතිබව හඳුන්වාදුන් න්‍යායාචාර්ය වරයා වන්නේ,
   1. නන්දිකේෂ්වර 2. භරතමුනි 3. මෙයර් හෝල්ඩ්
   4. ධනංජය 5. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (.........)

05. සංස්කෘත නාට්‍ය කලාවේ අර්ථෝපක්ශේප වලට අයත් වන්නේ,
   1. ප්‍රවේශක, අංඛමුඛ, විශ්කම්භක, චූලිකා 2. අංකවතාර, ප්‍රාප්ත්‍යාශා, බීජ, බිංදු
   3. ප්‍රවේශක, චූලිකා, පතාකා, කාර්ය 4. චූලිකා, අංඛමුඛ, ප්‍රාප්ත්‍යාශා, නියතාප්ති
   5. බිංදු, පතාකා, චූලිකා, අංඛමුඛ (.........)

- **පහත සඳහන් තොරතුරු ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා පිළිතුරු සැපයීමට අදාල කරගන්න.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| A | ජස ලෙන්චිනා | B | විධුර | C | කරලිය | D | ප්‍රතාප්සිංං |
| E | පේසාලෙයි | F | දුක්ඛප්‍රාප්ති | G | බලිවාලා | H | වැරදුණු කුරුමානම |
| I | මද්දලය | J | වෙස්මුහුණ | K | සෝෂක බෙරය | L | හඬ දූතයෝ |
| M | තබ්ලාව | N | පෙරලෙන ඉරණම | O | ආදම් හා ඒව | | |

06. නාඩගම් හා සම්බන්ධ වන්නේ,
1. A, B හා C ය. 2. C, H හා K ය. 3. G, I හා M ය.
4. C, I හා L ය. 5. M, N හා O ය. (.........)

07. කෝලම් ගැමි නාටකය හා සම්බන්ධ වන්නේ,
1. A, C හා O ය. 2. D, H හා J ය. 3. C, J හා K ය.
4. K, M හා N ය. 5. B, H හා L ය. (.........)

08. නූර්ති නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
1. D, G හා L ය. 2. E, I හා K ය. 3. B, I හා O ය.
4. K, M හා O ය. 5. B, G හා M ය. (.........)

09. පාස්කු නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
1. A, D හා E ය. 2. E, F හා O ය. 3. J, K හා M ය.
4. E, G, O ය. 5. A, C හා J ය. (.........)

10. ටීටර් හා මිනර්වා නට්‍ය සම්බන්ධ වන්නේ,
1. D, F හා L ය. 2. F, I හා L ය. 3. E, F හා O ය.
4. D, H හා N ය. 5. G, J හා N ය. (.........)

11. සන්නියකුම යාගයට අදාල නිවැරදි පිළිතුර වන්නේ,
1. රුහුණු බෙරය හා උඩරට බෙරය භාවිතා වේ.
2. ඇඳුරන් වෙස් මුහුණු නොපලඳි.
3. රංග භූමි අලංකරණ ලෙස තොරණ් යොදාගනී.
4. සූනියම් යක්ෂණිය වේෂ තුනික් රංගයට පිවිසේ.
5. ගැබිනි මව්වරුන් සඳහා පවත්වයි. (.........)

12. බෞද්ධ පූජාකර්ම සඳහා අදාල වන්නේ,
1. ආලවක දමනය, යුගාසන බණ, මිලින්ද ප්‍රශ්නය
2. මිලින්ද ප්‍රශ්නය, ගිනි සන්නිය, දීපංකර කතාව
3. පත්තිනි උපත, පිරිත් පිංකම, දොරකඩ හස්න
4. දොරකඩ අස්න, ඇත් බන්ධන, මී බන්ධන
5. ගඳහ යක්ෂයා, සති පිරිත, කොහොඹා උපත (.........)

13. මඩු ශාන්තිකර්ම සඳහා අදාල වන්නේ,
1. ගර්භ සංරක්ෂණ පූජා කර්මයන්ය. 2. කොහොඹා දෙවියන් පුද ලබයි.
3. මංගර දෙවියන් පුද ලබයි. 4. සබේ විදානේ ප්‍රමුඛව ඉදිරිපත් කෙරේ.
5. සූනියම් කිරීම ප්‍රධානව සිදුවේ. (.........)

14. විශ්ව විද්‍යාල කොලිජියේ ලංකා විශ්ව විද්‍යාල නාට්‍ය සංගමයේ පුරෝගාමියා වන්නේ,
1. එදිරිවීර සරච්චන්ද්‍ර 2. EFC ලුඩෝවයික් 3. අයිරාංගනි සේරසිංහ
4. ඈෂ්ලි හල් පේ 5. නියුමාන් ජුබාල් (.........)

15. ඔයගොල්ලො යන්න, මොකක්ද හිත යට හංගගෙන ඔය කතා කරන්නේ. ඔයගොල්ලො කියන ඒව අහන්න මට ඕන කමක් නෑ. මේ සංවාදය පසන්නේ.
1. අනසූයා 2. ගෞතමී 3. දුෂ්‍යන්ත 4. විදූෂක 5. සකුන්තලා(.........)

- **අංක 12 සිට 14 දක්වා පිළිතුරු සැපයීමට පහත රූප සටහන් අදාල කරගන්න.**




**A** **B** **C** **D** **E**

16. A රූප සටහනින් දැක්වෙන්නේ,
    1. අණබෙර කෝලම 2. නොංචි කෝලම 3. පොලිස් කෝලම
    4. ජස කෝලම 5. මුදලි කෝලම (.........)

17. B රූප සටහනින් දැක්වෙන්නේ,
    1. කණ සන්නිය 2. බිහිරි සන්නිය 3. ගුල්ම සන්නිය
    4. ගොලු සන්නිය 5. පිස්සු සන්නිය (.........)

18. එක ළමයෙක් වඩාගෙන නම් ගොඩක් කියවන චරිතයට අදාල මුහුණ වන්නේ,
    1. A ය. 2. B ය. 3. C ය. 4. D ය. 5. E ය. (.........)

19. කොහොඹා කංකාරියේ පුද ලබන දෙවිවරුන් වන්නේ,
    1. නාත, පත්තිනි, දැඩිමුණ්ඩ 2. ඉරුගල් බණ්ඩාර, කන්දේ බණ්ඩාර, වීරමුණ්ඩ
    3. වැදි යකා, කොහොඹ යකා, දෙවොල් දෙවි 4. කඩවර, දෙවොල්, විෂ්ණු
    5. දෙවොල්, මහසෝනා, කලුකුමාර (.........)

20. කිරිමඩුවට අයත් නාට්‍යමය අවස්ථාව නොවන්නේ,
    1. ඇත් බන්ධන 2. මී බන්ධන 3. අඹ විදමන
    4. මංගර සමයම 5. මුරුතැන් තැබීම (.........)

21. නූර්ති ගීතයක් නොවන්නේ,
    1. දන්නෝ බුදුන්ගේ 2. දැක්කොත් පද්මාවති 3. මගෙ මන්ත්‍රී නම් බිසෝගේ
    4. අද වෙස්සන්තර රාජ පුතා 5. ගම්බිර තෙදැති කොන්තන් තීනු පුරේ (.........)

22. නාට්‍ය පෙළක ස්වභාවය වන්නේ,
    1. කිසියම් අවස්ථාවක්, සිද්ධියක් හෝ අත්දැකීමක් තුළින් රූපණය සඳහා නිර්මාණය වීමයි.
    2. කියවා රස විඳීමට සකස් කර තිබේ.
    3. රූප පද්ධතියක් ඒකාබද්ධ කර තිබීම.
    4. සෙමින් අවස්ථා මතුකර දීම.
    5. ආනුෂංගික ශිල්ප දායාද කර තිබීම. (.........)

- **අංක 23 සිට අංක 29 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාල කරගන්න.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| A | බිංදු | B | රති | C | ප්‍රයත්න | D | විභාව |
| E | ප්‍රවේශක | F | අංඛමුඛ | G | අනුභාව | H | ප්‍රකරි |
| I | ශෝක | J | ව්‍යසංඛාරිභාව | K | විශ්මය | L | ප්‍රාප්ති සම්භව |
| M | චූලිකා | N | ඵලයෝග | O | කාර්ය | | |

23. සංස්කෘත නාට්‍ය අර්ථ ප්‍රකෘති හා සම්බන්ධ වන්නේ,
    1. A, C හා E ය. 2. E, H හා I ය. 3. K, M හා O ය.
    4. B, G හා L ය. 5. A, H හා O ය. (.........)

24. සංස්කෘත නාට්‍යයේ නාට්‍යමය අවස්ථා හා සම්බන්ධ වන්නේ,
    1. B, G හා J ය. 2. A, D හා K ය. 3. E, H හා O ය.
    4. C, L හා N ය. 5. I, K හා M ය. (.........)

25. අර්ථෝපක්ශේෂ හා සම්බන්ධ වන්නේ,
    1. E, H හා O ය. 2. E, F හා M ය. 3. A, D හා G ය.
    4. G, I හා K ය. 5. M, N හා O ය. (.........)

26. ස්ථායිභාව හා සම්බන්ධ වන්නේ,
    1. A, B හා C ය. 2. D, E හා H ය. 3. B, I හා K ය.
    4. I, M හා O ය. 5. B, I හා K ය. (.........)

27. රස සිද්ධාන්තයට අයත් වන්නේ,
 1. D, G හා J ය. 2. J, L හා M ය. 3. A, H හා L ය.
 4. D, I හා M ය. 5. B, F හා L ය. (.........)

28. සකුන්තලාව රජතුමා මුණගැසීමට සූදානම් වන අවස්ථාවේ ඇයට ආභරණ ලැබුනේ,
 1. දුෂ්‍යන්තගෙනි. 2. විදූෂකගෙනි. 3. වනස්පතීගෙනි.
 4. ගෞතමීගෙනි. 5. ප්‍රියංවදාගෙනි. (.........)

29. දුෂ්‍යන්ත රජුගේ රාජ්‍ය වංශය වන්නේ,
 1. රාජ වංශය 2. ඉන්ද්‍ර වංශය 3. බ්‍රහ්ම වංශය
 4. පුරු වංශය 5. මෞර්ය වංශය (.........)

- **පහත සඳහන් වගුවේ ඇති නාට්‍ය ගීත ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A වන්මේ අරන්නේ - මඳ බිය වන්නේ
B අම්බරයේ සඳ සේ දිලි රූ පාවති.
C දවාලේ පායන චන්ද්‍රයා මේ අව්වා.
D වගුරට නරනිඳු දඹදිව් පරසිඳු.
E නොහඬනු කුමරුනි ඇවිල ලසෝගිනි.
F මේ කුමරුන්හට වන්නට පියඹ.
G අපි ගමට යමු ගමට යමු බිරිඳ බලාලා මගේ නෑදෑයෝ
H යුධ භටය යනු යුධයට - ඉදින්නෙමි මම ඔබ එනතුරා
I කුමක් දො මේ සාපෙ ලෙනේ මෙ විසීමෙ.
J පායන සඳ වැන්නේ - දුටුවන් මන පිනවන.

30. සාජන් නල්ලතම්බි සහ මී පුරවැසියෝ නාට්‍යයෙහි ගීත වන්නේ,
 1. A හා D ය. 2. C හා J ය. 3. G හා J ය.
 4. C හා F ය. 5. H හා I ය. (.........)

31. 1956 දී වේදිකාගත වූ සරච්චන්ද්‍රයන්ගේ සුවිශේෂී නාට්‍ය ධර්මී නාට්‍යයේ ගීත වන්නේ,
 1. A හා F ය. 2. C හා D ය. 3. B හා F ය.
 4. I හා J ය. 5. G හා I ය. (.........)

32. සිංහබාහු නාට්‍යයේ ගීතයන් වන්නේ,
 1. A හා C ය. 2. A හා E ය. 3. B හා H ය.
 4. H හා J ය. 5. D හා I ය. (.........)

33. කාලගෝල නාට්‍යයේ ගීතයන් වන්නේ,
 1. C හා D ය. 2. B හා G ය. 3. A හා B ය.
 4. G හා J ය. 5. E හා H ය. (.........)

34. හෙන්රි ජයසේනයන්ගේ නාට්‍ය දෙකක ගීත වන්නේ,
 1. C හා H ය. 2. D හා F ය. 3. E හා H ය.
 4. C හා I ය. 5. E හා J ය. (.........)

35. බොහෝ දේ සිදු වූ අතීතේ වැලලිලා ඇත අන්දකාරේ මෙය ගායනා කරනු ලබන්නේ,
 1. ගායකයෝය. 2. කුවේණිය. 3. දිසාලාය. 4. පූරකය. 5. ජීවහත්තය.(.........)

36. නාට්‍යයට අත්‍යාවශ්‍ය අංග තුන වන්නේ,
 1. නාට්‍ය පෙළ, නළුවා සහ ප්‍රේක්ෂකයා. 2. අධ්‍යක්ෂවරයා, නළුවා, ප්‍රේක්ෂකයා.
 3. අර්ථපති, නාට්‍ය පෙළ හා නළුවා. 4. නිෂ්පාදක, අධ්‍යක්ෂක හා නළුවා.
 5. පෙළ රචක, නළුවා හා අධ්‍යක්ෂ. (.........)

37. පින්තූර රාමු වේදිකාවක සුදු තිරය හඳුන්වන්නේ,
 1. ඉදිරි තිරයයි. 2. පැති තිරයයි. 3. ඉගිලුම් තිරයයි.
 4. වේදිකා තිරයයි. 5. ගඟනිකාව නමිනි. (.........)

38. රංගාලෝකයේදී වේදිකාවේ සුදුපාට කොටස් පමණක් විශේෂිත ආලෝක පහන වන්නේ,
 1. ස්ට්‍රෝබ් පහන 2. අල්ට්‍රාවයලට් පහන 3. හැලජන් පහන
 4. සෙවනැලි නිර්මිත පහන 5. යොමු පහන (.........)

39. ශරීරයේ සියලුම අංගයන් ලිහිල් කරමින් සිදුකරනු ලබන අභ්‍යාසය වන්නේ,
 1. ස්වසන අභ්‍යාසය 2. දර්පන අභ්‍යාසය 3. ශිථිලකරණ අභ්‍යාසය
 4. රිත්ම අභ්‍යාසය 5. තාපන අභ්‍යාසය (.........)

40. නාට්‍යයක චරිතයක් තම සිතුවිලි ප්‍රේක්ෂකයාට ඇසෙන ලෙස ප්‍රකාශ කිරීමේ ක්‍රමය හඳුන්වන්නේ,
 1. ආත්ම භාෂණය නමිනි. 2. ස්වයං කථනය නමිනි. 3. ඒකල භාෂණය නමිනි.
 4. සමූහ භාෂණ නමිනි. 5. ජනාන්තික භාෂණ ලෙසිනි. (.........)

# පළමු වාර පරීක්ෂණය

# නාට්‍ය හා රංගකලාව

## 13 ශ්‍රේණිය - I පත්‍රය

### II කොටස

- A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### A - කොටස

01. i. සංස්කෘත නාට්‍ය කතා වස්තුවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල. 2)
    ii. සංස්කෘත නාට්‍යයේ කතා වින්‍යාසය කොටස් කීය ද? ඒවා නම් කරන්න. (ල. 5)
    ii. ඔබ නම් කරන ලද කතා වින්‍යාසය කොටස් සඳහා සාකුන්තලය නාට්‍ය ඇසුරින් උදාහරණ දක්වන්න. (ල. 8)

02. i. කුවේණි නාට්‍යයට පාදක වූ ඓතිහාසික කතා පුවත කෙටියෙන් දක්වන්න. (ල. 4)
    ii. ස්ත්‍රිය පිළිබඳ කුවේණි නාට්‍ය රචකයාගේ දෘෂ්ටි කෝණය පැහැදිලි කරන්න.
    iii. නූතන කුවේණිය අධිකරණයෙන් කරන ඉල්ලීමට නඩුකාරයා දෙන පිළිතුර සාධාරණ ද? ඔබේ අදහස් දක්වන්න.

03. i. නාට්‍ය අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂණ කාර්යයේදී ඔහු සතු ගුණාංග මොනවා ද ?
    ii. අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරය පැහැදිලි කරන්න.
    iii. ඔබ නරඹන ලද නාට්‍යයක තේමාව, ශෛලිය, ගැටුම, රූපණ කාර්ය භාෂාව, අනුෂංගික අංග භාවිතය ආදිය නාට්‍ය සඳහා යොදාගෙන තිබූ ආකාරය විචාරයට ලක් කරන්න.

### B - කොටස

04. i. කලාව යන්න හඳුන්වා කලා ප්‍රබේද නම් කරන්න. (ල. 4)
    ii. නාට්‍ය කලාවේ මූලිකාංග 5ක් නම් කර 02ක් විස්තර කරන්න. (ල. 5)
    iii. ආහාර්ය අභිනයේ සාත්වික භාව නම්කර හඳුන්වන්න. (ල. 6)

05 i. සොකරි නාට්‍යයේ චරිත 2 ක් කෝලම් චරිත 2ක් නම් කරන්න. (ල. 4)
    ii. සොකරි හා කෝලම් නාට්‍යයේ චරිත දෙකක් විස්තර කරන්න. (ල. 5)
    iii. කෝලම් රංග ශෛලිය විස්තර කරන්න. (ල. 6)

06. i. රංග අභ්‍යාස 04ක් නම් කරන්න. (ල. 4)
    ii. රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා වලින් ලැබෙන ප්‍රයෝජන 8ක් ලියන්න. (ල. 4)
    iii. ආත්ම භාෂණය යන්න හඳුන්වා ශාකුන්තලය නාට්‍යයෙන් ආත්ම භාෂණ 02ක් ලියා දක්වන්න. (ල. 7)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

57 | S | II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
First Term Test - Grade 13 - 2019

# නාට්‍ය හා රංගකලාව II
## අපරදිග නාට්‍ය කලාව

විභාග අංකය .............................

කාලය පැය තුනයි

- **I කොටස සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.**
- **II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. කලාව නිර්වචනය කිරීම අසීරු වන්නේ ?
   1. එය ස්වභාවධර්මය හා සම්බන්ධ බැවිනි.
   2. එහි විෂය ක්ෂේත්‍රය අසීමිත බැවිනි.
   3. එය ප්‍රතිභාව මත පදනම්වන බැවිනි.
   4. එය පුද්ගල බද්ධවන බැවිනි.
   5. එහි විවිධ වර්ගීකරණය ඇති බැවිනි. (.........)

02. නාට්‍ය කලාවේ මූලික අරමුණ වන්නේ,
   1. උපදේශයක් හෝ දැනුමක් ලබාදීමයි.
   2. ප්‍රේක්ෂකයාට සෞන්දර්යාත්මක වින්දනයක් ලබා දීමයි.
   3. නරඹන්නන්ගේ පරිකල්පන ශක්තිය දියුණු කිරීමයි.
   4. මානසික විශ්‍රාන්තිය ලබාදීමයි.
   5. සමාජය යහමඟට හැරවීමයි. (.........)

03. ''ප්‍රාසාංගික කලාවන් සජීවී විය යුතුය'' ඒ සඳහා වඩා උචිත පිළිතුර වන්නේ ?
   1. පටිගත කල සංගීතය භාවිත නොකල යුතු නිසාය.
   2. වේදිකාවක් මත පමණක් රඟ දැක්විය යුතුය.
   3. රඟ දක්වන්නවුන් පමණක් සජීවීවීම ප්‍රමාණවත්ය.
   4. රඟ දක්වන්නවුන් මෙන්ම ප්‍රේක්ෂකයින් ද සජීවී විය යුතුය.
   5. ප්‍රේක්ෂකයා ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය යුතුය. (.........)

04. ''කරදිය'' හා ''නල දමයන්ති'' මුද්‍රා නාට්‍ය 2 හි නිර්මාතෘන් වන්නේ,
   1. එස්. පණීභාරත හා චිත්‍රසේන
   2. වජිරා හා චිත්‍රසේන
   3. වජිරා හා ප්‍රේමසිරි කේමදාස
   4. චිත්‍රසේන හා කේමදාස
   5. ප්‍රේමකුමාර එපිටවල හා චිත්‍රසේන (.........)

05. ''ඔපෙරාව'' සම්බන්ධව නිවැරදි වන්නේ,
   1. ''හංසවිල'' ඔපෙරාවකි.
   2. ඔපෙරාවෙහි සංගීතයට ප්‍රමුඛත්වය නොලැබේ.
   3. ඉතාලියේ මෙන්ම චීනයේ ද ජනප්‍රිය කලාවකි.
   4. කිසිවිටක කථා වස්තුවක් අන්තර්ගත නොවේ.
   5. වර්තමානයේ භාවිතයෙන් ඉවත් වී ඇත. (.........)

06. ''ගීත නාටක'' සම්බන්ධව වඩාත් නිවැරදි වන්නේ,
1. පෙරදිග ගීත නාටක කිසිවිටක බටහිර ඔපෙරා ආභාසය ලබා නැත.
2. ගායනයට වඩා රංගනයට ප්‍රමුඛත්වය හිමි නොවේ.
3. කථා වස්තු පදනම්ව ගොඩ නැගෙන්නේ නැත.
4. ''මනෝහරී'' ක්ෂේමදාසයන්ගේ ගීත නාටකයකි.
5. ''දෙපානෝ'' ඩබ්.බී. මකුලොළුවගේ පර්යේෂණාත්මක නාට්‍යයකි. (.........)

07. ට්‍රැජඩි හෙවත් ශෝකාත්ම නාට්‍යක මූලිකාංග 6 ඇරිස්ටෝටල් පෙලගස්වා ඇති අනුපිළිවෙල වන්නේ,
1. වස්තුව, චින්තනය, චරිත, ප්‍රේක්ෂාව, සංගීතය, වාග් විලාසය
2. වස්තුව, චරිත, චින්තනය, වාග් විලාසය, ප්‍රේක්ෂාව, සංගීතය
3. චරිත, වස්තුව, චින්තනය, ප්‍රේක්ෂාව, වාග් විලාසය, සංගීතය
4. වස්තුව, චරිත, වාග් විලාසය, චින්තනය, ප්‍රේක්ෂාව, සංගීතය
5. චරිත, වස්තුව, චින්තනය, සංගීතය, ප්‍රේක්ෂාව, වාග් විලාසය (.........)

08. ඕර්කිස්ට්‍රාව, ප්‍රේක්ෂාලය හා වේදිකා ගෘහය යන අංගත්‍රය සහිත නිර්මාණය වූ රංග භූමි අන්තර්ගත රට වන්නේ,
1. රෝමය හා ග්‍රීසිය  2. එංගලන්තය හා ප්‍රංශය  3. ග්‍රීසිය
4. ප්‍රංශය  5. රෝමය (.........)

09. ප්‍රොසීනියම් වේදිකාවක පසුතල දර්ශන මැවීමට, රංගාලෝකය මගින් විශේෂ වෙනස්කම් කිරීමට, කාලය ඇඟවීමට උපකාරී වනුයේ පහත දැක්වෙන වේදිකා තිර අතරින් කුමක් ද ?
1. හරස් තිරය  2. ගගනිකාව හෙවත් අහස් තිරය
3. ප්‍රධාන තිරය  4. පැති තිර  5. පසුපස තිර (.........)

10. රංගභූමි ආලෝකය හා සම්බන්ධව නිවැරදි වන්නේ ?
1. ගගනිකාව ආලෝකමත් කිරීමට හැලජන් පහන වැඩි වශයෙන් භාවිත කරයි.
2. අත්භූත බව, විශ්මය ආදී හැඟීම් මැවීමට අල්ට්‍රාවයලට් පහන භාවිත කරයි.
3. සිනොමයිඩ් ජෙපර්ස් භාවිතයේ දී පරාජම්බුල කිරණ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.
4. ධාරා පහනට භ්‍රමණයවන සිදුර සහිත පුවරුවක් සවිකිරීමෙන් වර්ණ චක්‍රය සදයි.
5. ධාරා පහන සිලින්ඩරාකාර හැඩයකින් ඉහල සිට පහළට විහිදෙන ආලෝක ධාරා සහිතය. (.........)

11. අංග රචනය හා සම්බන්ධව නිවැරදි වන්නේ,
1. සෑම විටම අතිශෝක්තියෙන් අංග රචන භාවිත වේ.
2. ලෝක ධර්මී නාට්‍ය දර්ශනයට අංග රචනය අත්‍යවශ්‍ය නොවේ.
3. ආලෝකය මඟින් ඇතිවන මුහුණේ පැතලි බව දුරු කිරීමට අංග රචනය ප්‍රධාන කාර්යයක් ඉටු කරයි.
4. අංග රචකයා ඍජුව ප්‍රේක්ෂකයාට ඍජුව සම්බන්ධය.
5. අධ්‍යක්ෂවරයාගේ අර්ථකතනය අංග රචන ශිල්පියාට අදාල නොවේ. (.........)

12. ග්‍රීක නාට්‍යරචක සොෆොක්ලීස් පිළිබඳ නිවැරදි වන්නේ,
1. අවු. 80 ජීවත් විය.
2. උපත ලැබුවේ ක්‍රි.පූ. 497
3. කිසිවිටක තම නාට්‍යකට ප්‍රථම ස්ථානය හිමි කරගත්තේ නැත.
4. ගායන වෘන්දය දොලසක් දක්වා අඩු කළේය.
5. ජ්‍යෙෂ්ඨම ග්‍රීක ශෝකාත්ම නාට්‍ය රචකයාය. (.........)

13. ග්‍රීක ශෝකාත්ම නාට්‍ය සම්බන්ධ නිවැරදි වන්නේ ?
1. ග්‍රීක ශෝකාත්මයක ආකූලීකරණය යනු සිදුවීම පැහැදිලි වීමයි.
2. ග්‍රීක ශෝකාත්මයක ඛේදනීය වීරයා දූර්භාග්‍යයේ සිට සෞභාග්‍ය කරා ගමන් ගනී.
3. මූලාශ්‍රය කොටගන්නා පුරාකථාව ඒ අයුරින් ම ඇත.
4. ඇරිස්ටෝටල් කාව්‍ය ශාස්ත්‍රය සම්පාදනය වනවිට ශ්‍රේෂ්ඨම ග්‍රීක ශෝකාත්ම නාට්‍ය රචකයා වී අවසන්ය.
5. පෞර දියොනීසියා උත්සවයට ඉදිරිපත් කරන ලද්දේ ශෝකාත්ම නාටක පමණි. (.........)

14. ප්‍රේක්ෂාව හා ප්‍රේක්ෂකයා සම්බන්ධ නිවැරදි වන්නේ,
1. ප්‍රේක්ෂාව වූ කලී වේදිකාවේ පසුතල හා රංගාලෝකයයි.
2. වේදිකාවේ ප්‍රේක්ෂාව මවනු ලබන්නේ ප්‍රේක්ෂකයාය.
3. ප්‍රේක්ෂාව මොහොතින් මොහොත වෙනස් වේ.
4. මංගල දර්ශනය තුල ප්‍රේක්ෂකයා නැත.
5. ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ප්‍රේක්ෂාව වෙනස් වේ. (.........)

15. නළුවා හෝ නිළිය රූපණයෙහි යෙදිය යුත්තේ බුද්ධිමය ප්‍රතික්‍රියාවක් දක්වන්නකු ලෙස විනා අවේශයන් නොවනබව ප්‍රකාශ කල න්‍යායාචාර්යවරයෝ හා ඔහුගේ රංග රීතිය අන්තර්ගත පිළිතුර වන්නේ,
   1. කොන්ස්ටාන්ටින් ස්ටැනිස්ලාවුස්කිගෙ තද්විධි ක්‍රමය.
   2. බර්ටෝල් බ්‍රෙස්ට් ආඛ්‍යාන රංග රීතිය.
   3. භරතමුණිගෙ නාට්‍ය ශාස්ත්‍රයේ සඳහන් බාහ්‍ය රංගය.
   4. ඉසුම් අම්සාවාගේ මානසික එලඹුම.
   5. මෙයර්හෝල්ඩ්ගෙ ජෛව යාන්ත්‍රණය. (.........)

- **අංක 16 සිට 20 දක්වා පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාල කරගන්න.**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| A | - | කෝප්‍රස් ක්‍රිස්ටි උත්සවය. | B | - | ඉලෙක්ට්‍රා | C | - | වළාකුළු |
| D | - | පැරඩෝස් | E | - | ගැලීලියෝ | F | - | ඇගමෙම්නොන් |
| G | - | ලයිසිස්ට්‍රාටා | H | - | වෙළඳ ශ්‍රේණි | I | - | ස්කීනය |
| J | - | දිරිය මව. | K | - | ඔකෙස්ට්‍රා | L | - | පුන්තිලා |
| M | - | ට්‍රෝජන් කාන්තාවෝ | N | - | මැඩියෝ | O | - | ප්‍රාතිහාර්ය නාට්‍ය |

16. ජන වන්දනා නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
   1. C D හා N ය. 2. B E හා G ය. 3. A H හා O ය.
   4. B D හා I ය. 5. F G හා K ය. (.........)

17. ග්‍රීක නාට්‍ය රඟහල හා සම්බන්ධ වන්නේ,
   1. A C හා E ය. 2. C G හා I ය. 3. B F හා K ය.
   4. C G හා M ය. 5. D I හා K ය. (.........)

18. ග්‍රීක ට්‍රැජඩි නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
   1. F H හා J ය. 2. E H හා N ය. 3. B D හා E ය.
   4. B F හා M ය. 5. A C හා O ය. (.........)

19. ග්‍රීක කොමඩි නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
   1. C G හා N ය. 2. D E හා H ය. 3. A F හා K ය.
   4. B G හා L ය. 5. C H හා M ය. (.........)

20. ආඛ්‍යාන රංග රීතිය හා සම්බන්ධ වන්නේ,
   1. D I හා N ය. 2. E J හා L ය. 3. E I හා O ය.
   4. B H හා N ය. 5. C H හා L ය. (.........)

21. ජුලියස් සීසර් නාට්‍යයේ බ්‍රූටස්ට දිවි නසාගනු පිණිස අසිපත දරා සිටියේ,
   1. පින්ඩාරස් 2. ඉසිලස් 3. ස්ට්‍රාටෝය. 4. කැෂියස් 5. ඇන්ටනි (.........)

22. නාට්‍ය විචාරයට මූලික පදනම වන්නේ,
   1. නාට්‍ය පිටපතයි. 2. නාට්‍ය නිෂ්පාදනයයි. 3. ආනුෂංගික අංගයයි.
   4. නළු නිළියන්ය. 5. නාට්‍ය අධ්‍යක්ෂණයයි. (.........)

23. ග්‍රීක හා ශේක්ස්පියර් නාට්‍ය වර්ග දෙකට පොදු නොවන්නේ,
   1. දහවල් කාලයේ රඟ දැක්වීම. 2. එළිමහන් රංග භූමිය භාවිතා වේ.
   3. ඛේදනීය වීරවරයෙක් සිටී. 4. වෘත්තානුකූල බස්වහරක් භාවිතා වේ.
   5. ස්ත්‍රීන් රංගනයට සහභාගී නොවේ. (.........)

24. එළිසබතීන නාට්‍යයට අදාල නිවැරදි ප්‍රකාශය වන්නේ,
   1. රෝම නාට්‍යයෙන් ආභාසය ලබා ඇත.
   2. ක්‍රි.ව. 1558 - 1603 අතර කාලය එම යුගයට අයත්ය.
   3. එළිමහනේ රාත්‍රියේ රංගනය විය.
   4. සොෆොක්ලීස්, බර්නාඩ් ෂෝ ශේක්ස්පියර් යුගයට අයත්ය.
   5. ශේක්ස්පියර් ශෝකාන්ත හා සුඛාන්ත පමණක් රචනා කරන ලදි. (.........)

25. ග්‍රීකයන් ට්‍රැජඩි නාට්‍ය නැරඹීමේදී සිතේ සිරකරගෙන සිටි භය හා කරුණාව යන හැඟීම් සෙසු ප්‍රේක්ෂකයන් හා එළිපිට ප්‍රකාශයට පත් කිරීම නැතහොත් භාවයන් පිට කර ගැනීම හැඳින්වෙන්නේ,
   1. භාව සංතර්පනය නමිනි. 2. ට්‍රගෝඩියා නමිනි. 3. වේදිතයන් නමිනි.
   4. සරල හා සංකීර්ණ නමිනි. 5. කතාර්සීස් නමිනි. (.........)

26. ඇරිස්ටෝටල් කාව්‍ය ශාස්ත්‍රයේ ඇති පරිච්ඡේද සංඛ්‍යාව වන්නේ,
1. 26 කි. 2. 25 කි. 3. 28 කි. 4. 27 කි. 5. 29 කි. (.........)

27. මධ්‍යකාලීන යුරෝපා චක්‍ර නාටක සම්බන්ධ වන්නේ,
1. වෙළඳ ශ්‍රේණි සහභාගී නොවීය. 2. යෝක් චක්‍රයට නාටක මාලා 48 කි.
3. ආනුෂංගික අංග නොතිබුණි. 4. දේවාලය වටා සංකේත රැගෙන ගියහ.
5. රංග ශාලාව දෙව්මැදුර මැද තිබුණි. (.........)

- **අංක 28 සිට 30 යන ප්‍රශ්නවලට නොගැලපෙන නාමය තෝරන්න.**

28. 1. කුරුල්ලෝ 2. මණ්ඩුකයෝ 3. දෙඹරු 4. කක්බයි 5. සාමය (.........)

29. 1. පියානෝව 2. නත්තල් ගස 3. ඒප්‍රනය 4. මැකරූන් 5. කුරුසිය (.........)

30. 1. කැල්පර්නියා 2. පෝෂියා 3. ලින්ඩෙ 4. නූවිරා 5. සකුන්තලා (.........)

31. මිනිසාගේ දුර්ගුණ ඉවත් කරමින් පොදුවේ පවට බිය ඇති කරමින් යහපත් උපදේශ ලබාදුන් ජන වන්දනා නාට්‍ය ප්‍රභේදය වන්නේ,
1. මිස්ටරි නාට්‍යය 2. මිරැකල් නාට්‍යය 3. චක්‍ර නාට්‍යය
4. මොරැලිටි නාට්‍යය 5. ගොපළු නාට්‍යය (.........)

32. ජුලියස් සීසර් නාට්‍යයේ තේමාවක් නොවන්නේ,
1. උන්නතිකාමය 2. බල කාමය 3. යථාර්ථය හා සමානාත්මතාව
4. පලියට පලිය 5. සමූහාණ්ඩුවට එරෙහි රාජාණ්ඩුව (.........)

33. කැල්ෆර්නියා හට විපතක පෙර නිමිති පහලවන්නේ,
1. පළමු අංකය 2. දෙවෙනි අංකය 3. තුන්වන අංකය
4. හතරවන අංකය 5. පස්වන අංකය (.........)

34. ''ඔබට ඔබ නොපෙනෙන නිසා මම ඔබේ කැඩපත වෙන්නම්'' මෙය පවසන්නේ,
1. කැෂියස් 2. බ්රූටස් 3. ඔක්ටේවියස් 4. සීසර් 5. අන්ටනි (.........)

35. ''අමුත්තෙකුගේ කාමරේ රැයක් ගත කරන්න මට'' පුළුවන් කමක් නැහැ. මෙය පවසන ලද්දේ,
1. පෝෂියා 2. කැල්පර්නියා 3. අන්මරි 4. ලින්ඩෙ 5. නූවිරා (.........)

36. ''ඔහුගේ කියමන ගරු කරන්න හැසිරි නැත ඔහු මෝඩ ළදරුවකු පරිදි.''
1. ඊඩිපස් 2. ක්‍රෙයෝන් 3. අත්වැල 4. යොකස්ටා 5. ගොපල්ලා (.........)

37. රංග වින්‍යාසය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. නාට්‍යධර්මී ශෛලියට පමණක් සීමා වේ.
2. සංචලන පදනම් කරගෙන ආනුෂංගික කලා යොදාගෙන නිර්මාණය කරන වේදිකා චිත්‍රයයි.
3. නාට්‍ය පිටපත ප්‍රේක්ෂකයා හමුවට ගෙන ඒමට යොදා ගත්තකි.
4. නර්තනමය චලනයන්ට සීමා වූවකි.
5. රංග අවස්ථා අලංකරණය සඳහා යොදා ගත්තකි. (.........)

38. පින්තූර රාමු වේදිකාවේ පර්යාවලෝකනය පෙන්වීමට උපකාරී වන්නේ,
1. මැද තිරය 2. ප්‍රධාන තිරය 3. උඩු තිරය 4. ගගනිකාව 5. පැති තිරය(.........)

39. අවස්ථා ප්‍රති නිර්මාණය සඳහා වැඩි අවබෝධයක් ලබා දෙන්නේ,
1. රංග විධානයන්ය. 2. රංග වින්‍යාසය.
3. අංග රචනා ශිල්පියාය. 4. වේදිකා පරිපාලකය.
5. රංගාලෝක ශිල්පියාය. (.........)

40. නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ සාර්ථකත්වය මනින්නේ,
1. කාලය, ශ්‍රමය කැප කිරීමෙනි.
2. උපරිම තාක්ෂණය භාවිතා කිරීමෙනි.
3. මූලිකාංග හා ආනුෂංගික අංග හසුරුවමින් ප්‍රබල අරුතක් ලබාදීම තුලනි.
4. ආනුෂංගික අංග තුලිනි.
5. උපරිම ප්‍රේක්ෂක සහභාගිත්වයෙනි. (.........)

## පළමු වාර පරීක්ෂණය
## නාට්‍ය හා රංගකලාව
### 13 ශ්‍රේණිය - II පත්‍රය
### II කොටස

- **A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

### A කොටස

01. i. ප්‍රාසාසංගික කලා ප්‍රභේද 4 ලියන්න.
    ii. ඉහත සඳහන් ප්‍රභේද 2ක ආරම්භය හා විකාශය විස්තර කරන්න.
    iii. ඉහත කලා ප්‍රභේද නාට්‍ය කලාව සමඟ සසඳන්න.

02. i. වේදිකා නාට්‍යක යොදා ගන්නා ආනුෂංගික අංග 5 සඳහන් කරන්න.
    ii. ඉන් වර්ණ සම්බන්ධ කරගන්නා ආනුෂංගික අංග 2 විස්තර කරන්න.
    iii. නාට්‍ය ධර්මී නාට්‍යයක හා ලෝකධර්මී නාට්‍යයක පසුතල භාවිතය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

03. i. නාට්‍ය පෙළ තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 4ක් දක්වන්න.
    ii. අධ්‍යක්ෂවරයා නාට්‍ය පෙළ වේදිකාවට ගෙන ඒම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයන් සඳහන් කරන්න.
    iii. අධ්‍යක්ෂවරයා සතු විය යුතු ගුණාංග හා සක්‍යතා නාට්‍යයේ සාර්ථකත්වයට බලපාන ආකාරය විස්තර කරන්න.

### B කොටස

04. i. ග්‍රීක නාට්‍ය ප්‍රභවය හා විකාශය කෙටියෙන් විස්තර කරන්න.
    ii. ඇරිස්ටෝටල්ට අනුව ග්‍රීක ට්‍රැජඩියක මූලිකාංග විස්තර කරන්න.
    iii. ඊඩිපස් නාට්‍යයේ මතුවන ජීවන දෘෂ්ටිය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

05. i. නාට්‍ය රීතින් අතර රොමැන්ටික්, අසම්මත හා ස්වාභාවික නාට්‍ය රීති කෙටියෙන් විස්තර කරන්න.
    ii. යථාර්ථවාදී රීතියේ ආරම්භක නාට්‍යකරුවා කවුරුන්දැයි හඳුන්වා එම රීතියේ සුවිශේෂ ලක්ෂණ උදාහරණ සහිතව විස්තර කරන්න.
    iii. එපික් රංග ශෛලියේ සුවිශේෂතා පැහැදිලි කරන්න.

06. i. රූකඩ ගෙදර නාට්‍යයේ තරන්තලා නැටුම තුළින් අනාවරණය වූයේ කුමක් ද ?
    ii. පුරුෂාධිපත්‍යයෙන් යුතු සමාජයේ හෙල්මර් තුළ තිබූ ගති ලක්ෂණ 4ක් දක්වා එම ගති ලක්ෂණ ඉස්මතු වූ අවස්ථා 4ක් දක්වන්න.
    iii. නුව්රා හෙල්මට සැඟවූ රහස කුමක්දැයි දක්වා එම රහස අනාවරණයෙන් පසු නුව්රාගේ කුටුම්බයට සිදුවූයේ කුමක්දැයි උදාහරණ සහිතව විස්තර කරන්න.

## නාට්‍ය හා රංගකලාව 2019 - පළමු වාර පරීක්ෂණය
## 13 ශ්‍රේණිය - I පත්‍රය

### I කොටස - පිළිතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **01. -** | 5 | **11. -** | 4 | **21. -** | 5 | **31. -** | 1 |
| **02. -** | 2 | **12. -** | 1 | **22. -** | 1 | **32. -** | 5 |
| **03. -** | 3 | **13. -** | 3 | **23. -** | 5 | **33. -** | 2 |
| **04. -** | 2 | **14. -** | 2 | **24. -** | 4 | **34. -** | 3 |
| **05. -** | 1 | **15. -** | 5 | **25. -** | 2 | **35. -** | 4 |
| **06. -** | 4 | **16. -** | 4 | **26. -** | 3 | **36. -** | 1 |
| **07. -** | 3 | **17. -** | 1 | **27. -** | 1 | **37. -** | 5 |
| **08. -** | 5 | **18. -** | 3 | **28. -** | 3 | **38. -** | 2 |
| **09. -** | 2 | **19. -** | 2 | **29. -** | 4 | **39. -** | 3 |
| **10 -** | 4 | **20. -** | 3 | **30. -** | 2 | **40. -** | 1 |

### I පත්‍රය - II කොටස
### A කොටස

01. i. අධිකාරික, ප්‍රාසංගික
ii. 5 යි. (ආරම්භ, යත්න, ප්‍රාප්ත්‍යාශා, නියතාප්ති, ඵලාගම)
iii. උදාහරණ සහිතව එම අවස්ථා විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

02. i. විජය කුවේණි කතා පුවත කෙටියෙන් සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
ii. රචකයාගේ අදහස පැහැදිලි වී ඇත්නම් ලකුණු ලබා දෙන්න.
iii. ඇය අධිකරණයෙන් ඉල්ලා සිටින්නේ තම ස්වාමියා වූ විජයගේ සෙනෙහස ලබාදෙන ලෙසයි. එහෙත් නඩුකාරයා ඊට ලබාදෙන පිළිතුර වන්නේ ස්වාමියා ලබාදීමට උත්සාහයක් දැරිය හැකි වුවත් සෙනෙහස රැකවරණය ලබාදීමට කටයුතු කළ හැකි වුවත් සෙනෙහස රැකවරණය ලබාදීමට නීතිමය වශයෙන් පියවර ගත නොහැකි බවකි. මේ සඳහා අදහස් උදාරණ සහිතව ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

03. i. නිර්මාණ හැකියාව, පරිකල්පන ශක්තිය, සාමුහිකව කටයුතු කිරීම, සොඳුරු ආශ්‍වාදායකයෙක් වීම ආදි.
ii. පිටපත තෝරා ගැනීම, නිෂ්පාදන පිටපත සකස් කිරීම, නළු නිළියන් තෝරා ගැනීම, පිටපත කියවීම, පුහුණුවීම් ආනුෂංගික ශිල්පීය දායකත්වය, සවේශ පුහුණුව මංගල දර්ශනය ආදී ලෙස ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.
iii. නැරඹූ නාට්‍යයට අනුව ගැලපෙන ලෙස ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

### B - කොටස

04. i. කලාව යන්න හඳුන්වා ඇත්නම් ලකුණු දෙන්න. (ගැමි කලා, ප්‍රාකෘති කලා, ව්‍යවහාරික කලා)
ii. පිටපත, ආලෝකකරණය, අංග රචනය, වේදිකා අලංකරණ ප්‍රේක්ෂාව, ප්‍රේක්ෂකයා, වේදිකාව ආදී ලෙස නම්කර විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.
iii. ස්ථම්භ, රෝමාංච, අශ්‍රු, වේපථු, ස්වරභංග, වෛවර්ණ , ස්වේද ඵලය ආදී ලෙස නම්කර විස්තර කරන්න.

05. i සොකරි, පරයා, වෙදරාළ / ජස, ලෙන්චිනා, නොංචි, අණබෙර.
ii. සොකරි වලින් එක් චරිතයක් හා කෝලම් වලින් එක් චරිතයක් කවියකුත් සමඟ විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
iii. නාට්‍යධර්මී රංග ශෛලිය වෙස්මුහුණු පැළඳීම, කාරියකරවන රාළ විසින් චරිත හඳුන්වාදීම, සියලු චරිත පිරිමින් විසින් රඟපෑම, පූර්ව රංගය හා අපර රංගය ලෙස කොටස් දෙකක් තිබීම.

06. i * ශිථිලීකරණ අභ්‍යාසය * ස්වසන අභ්‍යාසය * කටහඬ අභ්‍යාසය * දර්පන අභ්‍යාසය
ii. ප්‍රයෝජන 5ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
iii. ''නාට්‍යයක චරිතයක් තමා සිතන දෙය ප්‍රේක්ෂකයාට දැනවීම සඳහා එය තමන්ට කියා ගැනීමක් සිදුකරයි. එසේ තම සිතුවිලි ප්‍රේක්ෂකයාට ඇසෙන සේ ප්‍රකාශ කිරීමේ, කථනය කිරීමේ ක්‍රමය අත්තම භාෂණය නම් වේ.

උදා : I. ශාකුන්තලය දෙවෙනි අංකය අවසානයේ
රජ - (තමාටම) වූ මහ චපලයෙක්, සමහරවිට මගේ හිතේ තියෙන ආසාවල් ගැන අන්තඃපුරයේ ඉන්න කුමාරිකාවන්ටත් කියාවි හොඳයි, මූට මම මෙහෙම කියන්නම්කෝ.

II. ශාකුන්තලයේ තුන්වන අංකයේ ශකුන්තලා රජු ගැන හැඟීමක් ඇතිවූ බව ප්‍රකාශ කළවිට ප්‍රියංවදාගේ ආත්ම භාෂණය.
ප්‍රියංවදා - (පසකට) එයාගෙ ප්‍රේමය බොහෝම දුර ගිය එකක්. වැඩිය කල්ගත කරන්න පුළුවන් කමත් නැහැ. එය පෙම්බැඳගෙන ඉන්න තැනැත්තා පුරු වංශයට ආභරණයක් වගේ කෙනෙක්. ඒක හින්දා එයාගේ ආසාව ගැන අපි සතුටු වෙන්න ඕනා.

# නාට්‍ය හා රංගකලාව 13 ශ්‍රේණිය - II පත්‍රය
## පිළිතුරු

### I කොටස

| | | | |
|---|---|---|---|
| **01. -** 2 | **11. -** 3 | **21. -** 3 | **31. -** 4 |
| **02. -** 2 | **12. -** 4 | **22. -** 5 | **32. -** 3 |
| **03. -** 4 | **13. -** 4 | **23. -** 4 | **33. -** 2 |
| **04. -** 2 | **14. -** 5 | **24. -** 2 | **34. -** 1 |
| **05. -** 3 | **15. -** 2 | **25. -** 5 | **35. -** 5 |
| **06. -** 5 | **16. -** 3 | **26. -** 1 | **36. -** 3 |
| **07. -** 4 | **17. -** 5 | **27. -** 2 | **37. -** 2 |
| **08. -** 1 | **18. -** 4 | **28. -** 4 | **38. -** 4 |
| **09. -** 2 | **19. -** 1 | **29. -** 3 | **39. -** 1 |
| **10 -** 2 | **20. -** 2 | **30. -** 5 | **40. -** 3 |

### II කොටස
### A - දේශීය නාට්‍ය කලාව

01. i. බැලේ, ඔපෙරා, ගීත නාට්‍ය, මුද්‍රා නාට්‍ය
    ii. විස්තර කර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
    iii. * කතා වස්තුවක් තිබීම. * ගැටුම තිබීම. * සතර අභිනය භාවිතා වීම.
    * ආනුෂංගික අංග යෙදීම. * මිනිස් ජීවිතය පහසුවෙන් විවරණය කරයි.
    * ඍජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ඇත. ආදී ලෙස කරුණු 4ක් වත් විස්තර කරයි නම් ලකුණු දෙන්න.

02. i. * රංගාලෝකය * අංග රචනය * සංගීතය * වේදිකා පසුතල * ඇඳුම් පැළඳුම් ආදී ලෙස ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
    ii. රංගාලෝකය, අංග රචනය, පසුතල ආදියෙන් දෙකක් පිළිබඳ විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.
    iii. පසුතල භාවිතයේ විශේෂතා ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

03. i. නිර්මාණශීලි වස්තු බීජය, රංගයට උචිත වීම, නාට්‍යෝචිත බව, ප්‍රේක්ෂක ප්‍රතිචාර, සාර්ථක අසාර්ථකත්වය, නාට්‍ය ශෛලිය, නළු / නිළි
    ii. පිටපත තෝරා ගැනීම හා අධ්‍යයනය කිරීම, නිෂ්පාදන පිටපත සකස් කිරීම, නළු වරණය, ආනුෂංගික අංග, ආනුෂංගික ශිල්පීන්, රඟුම් පාලක අවසරය, පෙල කියවීම, පුහුණුව, සවේෂ පුහුණුව, මංගල දර්ශනය ආදී ලෙස ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
    iii. බුද්ධිය, ප්‍රතිභාව, පරිකල්පන හැකියා, උපායශීලි බව, ඉවසීම, සුහද බව ආදිය නාට්‍යයේ සාර්ථකත්වයට බලපාන ආකාරය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

### B - කොටස

04. i. දියෝනිසස් ප්‍රභවය පිළිබඳව සඳහන්කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
    ii. කතා වින්‍යාසය, චරිත, වාග් විලාසය, චින්තනය ප්‍රේක්ෂාව සංගීතය පිළිබඳව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
    iii. ඊඩිපස් නාට්‍යයෙන් සමාජයට ගත හැකි ආදර්ශයන් හා ඊඩිපස් චරිතයෙන් ගත හැකි අත්දැකීම් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

05. i. රොමෑන්ටික් - අද්භූත, ප්‍රේමනීය චමත්කාර වැනි ආදා තිබීම. බුද්ධියට වඩා භාවයට ඉඩදීම. (ගර්තේ - Faust, ඇලෙක්සැන්ඩර්ඩූමා, යෙව්ගින් ෂවාර්ට්ස් - මකරා, ෂිලර් - ද රොබර් ඇන්ඩ් රොබර් ආදී....
    අසම්මත - ලෝක මහා සංග්‍රාම වලින් අනතුරුව මානසික බිඳ වැටීම් සමඟ ඇතිවීම. ඇල්බෙයාකැමු ගොඩෝ එනකල් - සැමුවෙල් බෙකට් ආදී...
    ස්වභාවික වාදි - ස්වභාවිකත්වය වේදිකාවට ගෙන ඒම, එමිල් සෝලා - තෙරේස්රැක්වින්, අන්ද්‍රෙ අන්තොයින් - ද බ්‍රවර් ආදී ලෙස ලියා ඇත්නම් ලකුණු දෙන්න.
    ii. හෙන්රික් ඉබ්සන් සහ ඔහුගේ යථාර්ථවාදී රංග රීතියේ ලක්ෂණ සඳහන් කරයි නම් ලකුණු ලබා දෙන්න.
    iii. බ්‍රෙෂ්ට්ගේ රංග රීතියේ සුවිශේෂතා ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

06. i. නෝරාගේ මානසික වනකුල ස්වභාවය.
    ii. පුරුෂාධිපත්‍ය, ආත්මාර්ථකාමිත්වය, අවස්ථාවාදී වීම, තම ගෞරවය ගැන පමණක් සිතීම, වියදම් කිරීමට තරමක් අකමැතිවීම. ආදී ලක්ෂණ මතු වූ අවස්ථා උදාහරණ සහිතව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
    iii. කෘගස්ටැඩ්ගෙන් ණයක් ලබා ගැනීම. එය හෙල්මගෙන් වසන් කිරීම. කුටුම්බය දෙදරා ගිය ආකාරය උදාහරණ සමඟ ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.